උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි: "සලාතය මා හා මාගේ ගැත්තා අතර අඩක් වශයෙන් බෙදා වෙන් කළෙමි. මාගේ ගැත්තාට ඔහු ඉල්ලූ දෑ ඇත

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) කරමින් සිටි ප්රකාශයකට මම සවන් දී ඇත්තෙමි යැයි පවසා අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර් තා කරන ලදී. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි: "සලාතය මා හා මාගේ ගැත්තා අතර අඩක් වශයෙන් බෙදා වෙන් කළෙමි. මාගේ ගැත්තාට ඔහු ඉල්ලූ දෑ ඇත. ගැත්තා 'අල්හම්දු ලිල්ලාහි රබ්බිල් ආලමීන්' යැයි පැවසූ විට උත්තරීතර අල්ලාහ්: මාගේ ගැත්තා මා ප්රශංසා කළේය' යැයි පවසයි. ඔහු 'අර්-රහ්මානිර් රහීම්' යැයි පැවසූ විට උත්තරීතර අල්ලාහ්: මාගේ ගැත්තා මා පැසසුමට ලක් කළේය යැයි පවසයි. ඔහු "මාලිකි යව්මිද් දීන්" යැයි පැවසූ විට ඔහු මාගේ ගැත්තා මා කීර් තියට පත් කළේය යැයි පවසයි. තවත් විටෙක මාගේ ගැත්තා මා වෙත පැවරීය යැයි පවසයි. ගැත්තා 'ඉය්යාක නඃබුදු වඉය්යාක නස්තඊන්' යැයි පැවසූ විට, ඔහු මෙය මා හා මාගේ ගැත්තා අතර පවතින්නකි. මාගේ ගැත්තාට ඔහු ඉල්ලූ දෑ ඇත. ඔහු 'ඉහ්දිනස් සිරාතල් මුස්තකීම්, සිරාතල්ලදීන අන්අම්ත අලයිහිම් ගයිරිල් මග්ලූබි අලයිහිම් වලල්-ළාල්ලීන්' යැයි පැවසූ විට, මෙය මාගේ ගැත්තා සතුය. මාගේ ගැත්තාට ඔහු ඉල්ලූ දෑ ඇත යැයි ඔහු
පවසයි.
[صحيح] [رواه مسلم]

"හදීසුල් කුද්සි" දිව්ය ප්රකාශ සහිත හදීසයක උත්තරීතර අල්ලාහ් පවසා ඇති බව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ දන්වා සිටියහ. සලාතයේ සූරා අල්-ෆාතිහාව මා හා මාගේ ගැත්තා අතර කොටස් දෙකකට බෙදා ඇත්තෙමි. එහි එක් අඩක් මා සතුය. අනෙක් අඩ ඔහු සතුය. එහි පළමු අඩ: ප්රශංසාව, පැසසුම හා කීර්තිය අල්ලාහ්ට පුද කිරීමය. මම ඔහුට ප්රතිඵල පිරිනමමි. දෙවැනි අඩ: බැගෑපත්වීම හා පැතුම, මම ඔහු වෙනුවෙන් පිළිතුරු දෙමි. ඔහු ඉල්ලන දේ මම ඔහුට පිරිනමමි. සලාත් ඉටු කරන්නා: 'අල්හම්දු ලිල්ලාහි රබ්බිල් ආලමීන්' යැයි පැවසූ විට, 'මාගේ ගැත්තා මා ප්රශංසා කළේය' යැයි අල්ලාහ් පවසයි. ඔහු 'අර්-රහ්මානිර් රහීම්' යැයි පැවසූ විට අල්ලාහ්: මාගේ ගැත්තා මා පැසසුමට ලක් කළේය මට ප්රශංසා කළේය. මාගේ මැවීම්වලට කළ ආශිර්වාදයන් සම්බන්ධයෙන් ඔහු මා පිළිගත්තේය යැයි පවසයි. ඔහු "මාලිකි යව්මිද් දීන්" යැයි පැවසූ විට, අල්ලාහ්: මාගේ ගැත්තා මා කීර්තියට පත් කළේය යැයි පවසයි. එය විශාල ගෞරවයකි. ඔහු: 'ඉය්යාක නඃබුදු වඉය්යාක නස්තඊන්' යැයි පැවසූ විට, 'මෙය මා හා මාගේ ගැත්තා අතර වන්නක් යැයි අල්ලාහ් පවසයි. මෙම ආයතයේ අල්ලාහ් සතු පළමු අඩ "ඉය්යාක නඃබුදු" ඔබව පමණක් නමදිමු යන්නයි. එනම් අල්ලාහ් සතු දේවත්වය පිළිගැනීම හා නැමදුම තුළින් ප්රතිචාර දැක්වීමය. එමගින් අල්ලාහ් සතු අඩ අවසන් වන්නේය. එම පාඨයේ දෙවන අඩ ගැත්තා සතුය. එය 'ඉය්යාක නස්තඊන්' නම් අල්ලාහ්ගෙන් උදව් පැතීමයි. උදව් කරන බව අල්ලාහ් ඔහුට ප්රතිඥා දී ඇත. ඔහු 'ඉහ්දිනස් සිරාතල් මුස්තකීම් සිරාතල්ලදීන අන්අම්ත අලයිහිම් ගයිරිල් මග්ලූබි අලයිහිම් වලල්-ළාල්ලීන්' යැයි පැවසූ විට, අල්ලාහ්: මෙය මාගේ ගැත්තාගේ යටහත්පහත්භාවය හා පැතුමයි මාගේ ගැත්තාට ඔහු ඉල්ලූ දෑ ඇත. මම ඔහුගේ පැතුමට පිළිතුරු දෙමි.

http://sunnah.global/hadeeth/si/show/65099